# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1988 අංක 45 දරන

# උතුරු ලංකා වෛද්‍ය වෘත්තිකයන්ගේ විද්‍යාලය (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1988 නොවැම්බර් මස 24 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1988 නොවැම්බර් මස 25 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ: ශත 90 යි. තැපැල් ගාස්තුව: ශත 75 යි.

# 1988 අංක 45 දරන උතුරු ලංකා වෛද්‍ය වෘත්තිකයන්ගේ විද්‍යාලය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1988 නොවැම්බර් මස 24 වන දින]

එල්. ඩී. ඕ. 55/86

**උතුරු ලංකා වෛද්‍ය වෘත්තිකයන්ගේ විද්‍යාලය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

සාමාජිකයන් විසින් එකඟ වූ රීතිවලට අනුකූලව ස්වකීය පරමාර්ථ එළඹෙයි ලෙස ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා "උතුරු ලංකා වෛද්‍ය වෘත්තිකයන්ගේ විද්‍යාලය" යනුවෙන් හැඳින්වෙන සහ එලෙස ප්‍රකට විද්‍යාලයක් මෙතෙක් ස්ථාපනයෙහි පිහිටුවනු ලැබ ඇති හෙයින් ද: පූර්විකාව.

එකී විද්‍යාලය විසින් මෙතෙක් ස්වකීය පරමාර්ථ ක්‍රියාත්මක කොට ඇති හෙයින් සහ සංස්ථාගත කිරීම සඳහා ඉල්ලීමක් කර ඇති හෙයින් සහ එකී විද්‍යාලය සංස්ථාගත කරනු ලැබීම දැන් යෝග්‍ය සහ අවස්ථානුකූල වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1988 අංක 45 දරන උතුරු ලංකා වෛද්‍ය වෘත්තිකයන්ගේ විද්‍යාලය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. *ලුහුඬු නාමය.*

2. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වීමේ දින සිට සහ ඉන් පසු (මෙහි මින් මතු "විද්‍යාලය" යනුවෙන් සඳහන් කරනු ලබන) උතුරු ලංකා වෛද්‍ය වෘත්තිකයන්ගේ විද්‍යාලයේ දැනට සාමාජිකයන්ව සිටින හා සිටින තාක් තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවට ආරම්භක සාමාජිකයන් ඇතුළුව මින් මතු ඇතුළත් කරනු ලබන සාමාජිකයන් ද "උතුරු ලංකා වෛද්‍ය වෘත්තිකයන්ගේ විද්‍යාලය" යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, පොදු මුද්‍රාවක් තබා ගෙන එය පාවිච්චි කිරීමේ ද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය ඊට ඇත්තේ ය. තව ද, එකී සංස්ථාගත නාමයෙන් සංස්ථාව විසින් ද එයට විරුද්ධව ද සියලු අධිකරණවල නඩු පවරනු ලැබිය හැකි ය. *උතුරු ලංකා වෛද්‍ය වෘත්තිකයන්ගේ විද්‍යාලය සංස්ථාගත කිරීම.*

3. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පරමාර්ථ සඳහා ද ඒ පරමාර්ථ පහත දැක්වෙන පොදු පරමාර්ථ විය යුතු බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:— *සංස්ථාවේ පොදු පරමාර්ථ.*

(අ) වෛද්‍ය වෘත්තිකයන්ගේ, දන්ත වෛද්‍යවරයන්ගේ, හෙද සේවක/සේවිකාවන්ගේ, වෛද්‍ය රසායනාගාර තාක්ෂණ ශිල්පීන්ගේ, විකිරණ ලේඛකයන්ගේ, ඖෂධ වේදී භෛෂජිකයන්ගේ සහ අර්ධ-වෛද්‍ය පිරිස්වල දැනීම

සහ දක්ෂතා වැඩි දියුණු කිරීමට සැලසුම් කරන ලද පුහුණු වීමේ පාඨමාලා හෝ වෙනත් අධ්‍යාපන කටයුතු භාර ගැනීම හෝ ඒ කටයුතු භාරගැනීමෙහි ලා වෙනත් තැනැත්තන්ට සහාය දීම ;

(ආ) යම් ක්ෂේත්‍රයක ඇති වෛද්‍ය සේවාවල තත්ත්වය වැඩි දියුණු කිරීමේ අරමුණ ඇතිව, වෛද්‍ය වෘත්තිකයන් සහ වෛද්‍ය ශිෂ්‍යයන් විසින් වෛද්‍ය කටයුතු සම්බන්ධයෙන් පර්යේෂණ කරගෙන යාම දිරිගැන්වීම සහ ශ්‍රී ලංකාවෙහි විශේෂ අවශ්‍යතාවලට සහ ඒවායෙහි ලබාගත හැකි ආර්ථික සම්පත් කෙරෙහි නිසි සැලකිල්ල දෙමින් ඒ පර්යේෂණ කටයුතු භාර ගැනීම හෝ භාර ගැනීමෙහි ලා අන්‍යයන්ට සහාය දීම ;

(ඇ) වෛද්‍ය විද්‍යාව පිළිබඳව හෝ වෛද්‍ය වෘත්තියට සම්බන්ධ විද්‍යාත්මක විෂයයන් පිළිබඳව හෝ මුල් කෘතීන් වෛද්‍ය වෘත්තිකයන් විසින් පළ කිරීමට දිරි ගැන්වීම ;

(ඈ) වෛද්‍ය වෘත්තිකයන්ට, වෛද්‍ය වෘත්තිකයන් වශයෙන් සුදුසුකම් ලැබීමට සූදානම් වන ශිෂ්‍යයන්ට හෝ ආරෝග්‍ය ශාලාවල, ඖෂධ ශාලාවල, චිකිත්සාගාරවල, රසායනාගාරවල හෝ වෛද්‍ය, ශල්‍ය වෛද්‍ය සහ සෞඛ්‍ය සේවාවන් සැලසීමෙහි ලා වෛද්‍ය වෘත්තිකයන්ට සහාය වීමට පිහිටුවනු ලැබූ ඒ සමාන ආයතනවල සේවයෙහි නියුක්ත හෝ අර්ධ-වෛද්‍ය පිරිස් වශයෙන් සේවයෙහි නියුක්ත වීමට සුදුසුකම් ලබන තැනැත්තන්ට අධ්‍යාපනය, ඉගැන්වීම සහ පුහුණු වීම සඳහා අධ්‍යයන පාඨමාලා සහ පහසුකම් සැලසීමේ හෝ ඒවා වැඩි දියුණු කිරීමේ කාර්යය සඳහා යම් ආයතනයක් පිහිටුවීම, පවත්වාගෙන යාම, කළමනාකරණය කිරීම, සහ පරිපාලනය කිරීම ;

(ඉ) පරිපාලනය ඉගැන්වීම, වාසය කිරීම හෝ සංස්ථාවේ වෙනත් යම් කාර්යයක් සඳහා පුස්තකාල සහ වෙනත් ගොඩනැගිලි ඉදිකිරීම, ඒවාට උපකරණ සැපයීම සහ නඩත්තු කිරීම ;

(ඊ) සංස්ථාව පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සඳහා ද ඒ පරමාර්ථ මුදුන්පත් කර ගැනීමට අදාළ හෝ සම්බන්ධ සියලු කාරණා සම්බන්ධයෙන්, ලාභය සඳහා පිහිටුවනු නොලැබුවා වූ වෙනත් මණ්ඩල සමග සහයෝගීව කටයුතු කිරීම ;

(ද) පිළිගත් විදේශීය උපාධි අපේක්ෂක සහ පශ්චාත් උපාධි වෛද්‍ය විද්‍යා පුහුණුවීමේ මධ්‍යස්ථාන සමග සහ උපාධි හෝ පශ්චාත් උපාධි පිරිනැමීමට මග සළස්සන්නා වූ අධ්‍යාපන පාඨමාලාවලට විධිවිධාන සැලැස්වීම සඳහා 1978 අංක 16 දරණ ලංකා විශ්ව විද්‍යාල පනතේ විධිවිධානවලට අනුකූලව සහ 1980 අංක 1 දරන ආඥා පනතින් පිහිටුවන ලද පශ්චාත් උපාධි වෛද්‍ය විද්‍යා ආයතනය සමග සහයෝගීව ක්‍රියා කිරීම ;

(ධ) ශ්‍රී ලංකාවේ සහ විදේශීය ආයතන සමග ගුරුවරුන් හුවමාරු කර ගැනීමේ වැඩ සටහන් පිළිබඳව සාකච්ඡා කිරීම හා සංවිධානය කිරීම සහ අවශ්‍ය කවර හෝ විටක, විදේශවලින් ගුරුවරුන් බඳවා ගැනීම ;

(න) සංස්ථාවේ පරමාර්ථ මුදුන්පත් කර ගැනීමට හා වැඩිදියුණු කර ගැනීමට අවශ්‍ය හෝ හිතකර වෙනත් සියලු ක්‍රියා සහ දේ කිරීම :

එසේ වුවද සංස්ථාව පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සඳහා ද, ඒ පරමාර්ථ සහ ඊට ආනුෂංගික බලතල පහත දැක්වෙන විධිවිධානවලට යටත් විය යුතු ය :—

එනම්,

(i) යම් නියෝගයක්, සීමා කිරීමක් හෝ කොන්දේසියක් නිසා සංස්ථාවේ යම් පරමාර්ථයක් මගින් එය වෘත්තීය සංගමයක් බවට පත් කරවන්නේ නම්, එවැනි නියෝගයක්, සීමා කිරීමක් හෝ කොන්දේසියක් සඳහා සංස්ථාවේ අරමුදල් වලින් ආධාර කිරීම හෝ එහි සාමාජිකයන් හෝ වෙනත් තැනැත්තන් මත එවැන්නක් පැනවීම හෝ ඔවුන් ලවා එවැන්නක් පිළිපැදීමට පෙළඹවීම හෝ සංස්ථාව විසින් නොකළ යුතු ය ;

(ii) සංස්ථාවේ දැඩි ආරක්ෂාව යටතේ පවත්නා යම් විභාගයක් සමර්ථ වීම හෝ සංස්ථාව විසින් නිකුත් කරනු ලබන යම් අභිඥාන පත්‍රයක් හෝ වෙනත් සහතිකයක් දැරීම ලියාපදිංචි වෛද්‍ය වෘත්තිකයකු වශයෙන් ක්‍රියා කිරීමට සුදුසුකමක් විය යුතු බවට කෙලින් ම හෝ ව්‍යවස්ථා සම්පාදනය කර ගැනීම අත්කර ගැනීමට හෝ සංස්ථාව විසින් උත්සාහ නොකළ යුතු ය ;

(iii) මෙම වගන්තියේ සඳහන් කර ඇති පරමාර්ථ ඉටුකිරීමේ දී සංස්ථාව, තත්කාලයේ බලාත්මකව පවත්නා වෙනත් යම් ලිඛිත නීතියකට යටත් විය යුතු ය.

සංස්ථාවේ පාලක සභාව.

4. (1) මෙහි මින් මතු විධිවිධාන සලස්වා ඇති පරිදි සාදනු ලැබ, තත් කාලයෙහි බලපවත්නා සංස්ථාවේ රීතිවලින් විධිවිධාන සලස්වා ඇත්තා වූ ද, ඒ රීතිවලට අනුකූලව තෝරා පත් කර ගනු ලබන්නා වූ ද, නිලධරයන්ගෙන් සහ වෙනත් සාමාජිකයන් සංඛ්‍යාවකින් සමන්විත වූ සංස්ථාවේ පාලක සභාවක් විසින්, සංස්ථාවේ රීතිවලට යටත්ව, සංස්ථාවේ කටයුතු පරිපාලනය කරනු ලැබිය යුතු ය.

(2) මේ පනතේ උපලේඛනයෙහි සඳහන් කර ඇති නම් දරන විද්‍යාලයේ ආරම්භක සාමාජිකයන් සංස්ථාවේ පළමුවන සභාවේ සාමාජිකයන් විය යුතු අතර, ඔවුන් මේ පනත ආරම්භ වූ දිනයෙන් පසුව සංස්ථාවේ වාර්ෂික මහා සභා රැස්වීම පවත්වනු ලබනතෙක් ධුරය දැරිය යුත්තේ ය.

සාමාජිකයන්ගේ නාම ලේඛනය.

5. (1) මේ පනත ආරම්භ වන දිනයෙහි සංස්ථාවේ සාමාජිකයන් වන්නා වූ සෑම තැනැත්තකු විසින් ද, ඉන් පසුව සංස්ථාවේ සාමාජිකයකු වශයෙන් යථා පරිදි ඇතුළත් කරනු ලබන සෑම තැනැත්තකු විසින් ද, තම නම ඇතුළත් කරවා ගනු ලැබිය යුතු නාම ලේඛනයක් තබා ගැනීමට සංස්ථාවේ පාලක සභාව විසින් සලස්වනු ලැබිය යුතු ය.

(2) නාම ලේඛනයෙහි පහත දැක්වෙන විස්තර ඇතුළත් විය යුතු ය :—

(අ) එක් එක් සාමාජිකයාගේ නම සහ ලිපිනය ;

(ආ) සාමාජිකයා විසින් තම වෘත්තීය සුදුසුකම් සහ වෙනත් උපාධි ලබාගන්නා ලද දිනය ;

(ඇ) සාමාජිකයාගේ නම, නාම ලේඛනයෙහි ඇතුළත් කරනු ලැබූ දිනය ;

(ඈ) යම් තැනැත්තකු සාමාජිකයකුවීම අවසන් කරනු ලැබූ දිනය.

රීති සෑදීමට ඇති බලය.

6. (1) සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඉල්ලා අස්වීම හෝ නෙරපීම සඳහා ද, සංස්ථාවේ පාලක සභාවේ සහ සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ, අනුයෝජිතයන්ගේ සහ සේවකයන්ගේ පැවැත්ම සහ කාර්ය සඳහා ද, සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු පාලනය කිරීම සඳහා සහ එහි පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා ද, සංස්ථාව විසින්, කලින් කල, සාමාජිකයන්ගේ මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් මේ පනතේ විධිවිධානවලට අනනුකූල නොවන රීති සෑදීම සහ යෝජනා සම්මත කිරීම නීත්‍යානුකූල වන්නේ ය. ඒ රීති සහ යෝජනා සම්මත යම් ආකාරයකින් වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම, සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම, එවැනි රැස්වීමක දී කරනු ලැබිය හැකි ය.

(2) මේ පනත ආරම්භවන දිනයට පෙරාතුවම දිනයේදී බලාත්මකව පැවතියා වූ විද්‍යාලයේ රීති, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට පටහැනි නොවන තාක් සංස්ථාව විසින් සාදන ලද රීති ලෙස සලකනු ලැබිය යුතු අතර (1) වන උප වගන්තියේ විධිවිධානවලට අනුකූලව වෙනස් කිරීම, එකතු කිරීම සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සියලු සාමාජිකයන් සංස්ථාවේ තත්කාලයෙහි බල පවත්නා රීතිවලට යටත් විය යුතු ය.

සංස්ථාවේ ගිණුම්.

7. (1) සංස්ථාව විසින් භාරගනු ලැබුවා වූ ද වියදම් කරනු ලැබුවා වූ ද සියලු මුදල් සම්බන්ධයෙන් නිසි ගිණුම් තබා ගැනීමට සංස්ථාවේ පාලක සභාව විසින් සලස්වනු ලැබිය යුතු ය. තව ද, සංස්ථාවේ ගිණුම් යටත් පිරිසෙයින් සෑම වර්ෂයක දී ම එක් වරක්, පරීක්ෂා කොට විගණනය කරනු ලැබිය යුතු අතර, ආදායම හා වියදම පිළිබඳ ගිණුමෙහි සහ ශේෂ පත්‍රයෙහි නිරවද්‍යතාව යථා පරිදි සුදුසුකම් ලත් එක් විගණකවරයකු විසින් හෝ විගණකවරයන් වැඩි දෙනකු විසින් හෝ සහතික කරනු ලැබිය යුතු ය.

(2) මේ වගන්තියෙහි "සුදුසුකම් ලත් විගණකවරයා" යන්නෙන්—

(අ) ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක සාමාජිකයකු වන්නා වූ ද ගණකාධිකාරීවරයකු ලෙස වෘත්තියෙහි යෙදීමට එවැනි ආයතනයක් විසින් නිකුත් කරන ලද සහතිකයක් සතුව ඇත්තා වූ ද පුද්ගලයකු; හෝ

(ආ) ව්‍යාපාර ආයතනයේ එක් එක් නේවාසික හවුල්කරුවා ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක සාමාජිකයකු වන්නා වූ ද ගණකාධිකාරීවරයකු ලෙස වෘත්තියෙහි යෙදීමට එවැනි ආයතනයක් විසින් නිකුත් කරන ලද සහතිකයක් සතුව ඇත්තා වූ ද ගණකාධිකාරීවරුන්ගේ ව්‍යාපාර ආයතනයක්

අදහස් වේ.

විද්‍යාලය විසින් ගෙවිය යුතු සහ විද්‍යාලයට ලැබිය යුතු ණය.

8. මේ පනත ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී පවත්නා විද්‍යාලයේ සියලු ණය හා බැරකම්, මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවනු ලැබිය යුතු ය. තවද එකී දිනයේ දී විද්‍යාලයට අය විය යුතු සියලු ණය සහ විද්‍යාලයට ගෙවිය යුතු සාමාජික මුදල් හා දායක මුදල් සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

මුදල් සහ දේපළ අදාළ කිරීම.

9. සංස්ථාවේ මුදල් සහ දේපළ කවර වූ හෝ ස්ථානයකින් ව්‍යුත්පන්න වුව ද මෙහි දක්වා ඇති පරිදි හුදෙක් ම ස්වකීය පරමාර්ථ වැඩිදියුණු කිරීම උදෙසා අදාළ කරනු ලැබිය යුතු ය. තව ද, ලාභයක ආකාරයෙන් ඉන් කිසිම කොටසක් ලාභාංශයක්, සම්මාන මුදලක් හෝ අන්‍යාකාරයක් වශයෙන් සංස්ථාවේ සාමාජිකයන්ට කෙලින් ම හෝ අන්‍යාකාරයකින් ගෙවීම හෝ පැවරීම හෝ කරනු නොලැබිය යුතු ය.

දේපළ දැරීමට සංස්ථාවට ඇති බලය.

10. මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක් හෝ බද්දක් සම්බන්ධයෙන් වූ යම් සාධන පත්‍රයක් මත හෝ ප්‍රකාර, නැතහොත් යම් තෙස්තමේන්තු බැහැර කිරීමක් හෝ අන්‍යාකාරයක් මත හෝ ඒ ප්‍රකාර, වැඩදායී අයිතිකරු වශයෙන් හෝ භාරකරු වශයෙන් හෝ අන්‍යාකාරයකින් චංචල හෝ නිශ්චල දේපළ කිසිවක් අත් කර ගැනීමට හා දැරීමට චංචල හෝ නිශ්චල දේපළ සම්බන්ධයෙන් තත්කාලයෙහි බලාත්මකව පවත්නා යම් ලිඛිත නීතියකට යටත්ව නීත්‍යානුකූලව සංස්ථාවට හැකියාව සහ බලය ඇත්තේ ය. තව ද ඒ සියලු දේපළ සංස්ථාවේ තත්කාලයෙහි පවත්නා රීතිවලට යටත්ව නැතහොත් අදාළ සාධන පත්‍රයෙහි හෝ බැහැර කිරීමෙහි ඇතුළත් කොන්දේසිවලට යටත්ව භාරවල කාර්ය සඳහා හෝ ඒ මත (භාරවලට අදාළ යම් ලිඛිත නීතියක සහ බැහැර කිරීමේ අදාළ සාධන පත්‍රයක වූ විධිවිධානවලට සැම විට ම යටත්ව) ඒ දේපළ විකිණීමට, උකස් කිරීමට, බදු දීමට, හුවමාරු කිරීමට හෝ අන්‍යාකාරයකින් බැඳ තැබීමට හෝ බැඳීමකට යටත් කිරීමට පූර්ණ බලය මේ පනතේ කාර්ය සඳහා සංස්ථාව විසින් දැරිය යුතු ය.

දේපළ අත් කර ගැනීම, අරමුදල් ආයෝජනය කිරීම, ණය ලබාගැනීම ආදිය සඳහා බලය.

11. මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත් ව සංස්ථාව විසින් පහත දැක්වෙන කාර්ය කිරීම නීත්‍යානුකූල වන්නේ ය :—

(අ) සංස්ථාවේ කාර්ය සඳහා අවශ්‍ය ඉඩම් මිලට ගැනීම, අත්කර ගැනීම කුලියට ගැනීම සහ අන්‍යාකාරයකින් ලබා ගැනීම හෝ ගොඩනැගිලි ඉදිකිරීම. තව ද සංස්ථාවේ පරමාර්ථ වැඩිදියුණු කිරීමේ අරමුණ ඇතිව එම කාර්ය සඳහා නීත්‍යානුකූල ලෙස අත්කර ගනු ලැබිය හැකි අතර, අවස්ථානුකූල යයි සලකනු ලබන පරිදි, ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීම හෝ බැහැර කිරීම ;

(ආ) සංස්ථාවේ කාර්ය සඳහා වහාම අවශ්‍ය නොවන යම් අරමුදල්, සුදුසු යයි සංස්ථාව විසින් කල්පනා කරනු ලබන යම් ආකාරයකින් ආයෝජනය කිරීම සහ ඒ ආයෝජනය කලින් කල වෙනස් කිරීම සහ මාරු කිරීම ;

(ඇ) සංස්ථාවේ කාර්ය සඳහා යම් ඇපයක් මත මුදල් ලබා ගැනීම, හෝ ණයට ගැනීම සහ සංස්ථාවේ යම් ණයක් හෝ බැඳීමක් සුදුසු යයි කල්පනා කරනු ලබන යම් ආකාරයකින් සුරැකුම් කිරීම හෝ නිදහස් කිරීම ;

(ඈ) සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීම සඳහා අදහස් කරනු ලැබූ තෑගි හෝ ප්‍රදාන පිළිගැනීම ;

(ඉ) යම් පුණ්‍ය කාර්යයක් සඳහා මුදලින් සම්මාදම් වීම හෝ සහතික වීම ;

(ඊ) සංස්ථාව වෙනුවෙන් හෝ වෙනත් යම් පුණ්‍ය සංගමයක්, ආයතනයක්, සමිතියක් හෝ මණ්ඩලයක් අග වෙනත් යම් පුණ්‍ය භාරයක් වෙනුවෙන් භාරයක් වශයෙන් දරනු ලැබූ හෝ අයිතිකර ගනු ලැබූ නැතහොත් දරනු ලබන්නා වූ හෝ අයිති කර ගනු ලබන්නා වූ යම් නිශ්චල සහ පුද්ගල දේපළ කෙරෙහි බලපාන්නා වූ නීත්‍යනුකූල භාර සහ කොන්දේසි කිසිවක් භාර ගැනීම, පිළි ගැනීම, ක්‍රියාවේ යෙදවීම, ඉටු කිරීම සහ පරිපාලනය කිරීම.

**සංස්ථාවේ මුද්‍රාව.**

12. සංස්ථාවේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී මිස, සංස්ථාවේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු ය. ඔවුන් දෙදෙනා තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු අතර, ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට පරිබාහිරව විය යුතු ය.

**සාමාජිකයන්ගේ වගකීම සීමා කිරීම.**

13. සංස්ථාවේ ණය සහ බැරකම් නිදහස් කිරීමේ කාර්යය සඳහා හෝ වෙනත් යම් කාර්යයක් සඳහා හෝ සංස්ථාවේ කිසිම සාමාජිකයකු විසින්, ඔහුගෙන් සංස්ථාවට ලැබිය යුතු ඒ වාර්ෂික සාමාජික ගාස්තුවේ මුදල් ප්‍රමාණය ඉක්මවන යම් දායක මුදලක් ගෙවීමට යටත් නොවිය යුතු ය.

**විසුරුවා හැරීමේ දී ඉතිරිවන දේපළ.**

14. සංස්ථාව විසුරුවා හරිනු ලැබූ විට, එහි සියලු ණය සහ බැරකම් සෑහීමට පත් කිරීමෙන් පසුව කවර වූ හෝ දේපළක් ඉතිරිව තිබුණු හොත්, ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදා හරිනු නොලැබිය යුතු ය. එහෙත් සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ සහ එහි සාමාජිකයන් අතර යම් ආදායමක් හෝ ලාභයක් බෙදා හැරීම එහි රීති මගින් තහනම් කරනු ලැබ ඇත්තා වූ වෙනත් යම් ආයතනයකට හෝ ආයතනවලට දෙනු ලැබිය යුතු ය. නැතහොත් පවරනු ලැබිය යුතු ය. ඒ ආයතනය හෝ ආයතන සංස්ථාව විසුරුවා හරිනු ලබන අවස්ථාවේ දී හෝ ඊට පෙරාතුව ම, සංස්ථාවේ සාමාජිකයන් විසින් තීරණය කරනු ලැබිය යුතු ය. ඒ දේපළ හෝ ඉන් යම් කොටසක් හෝ මේ වගන්තියේ විධිවිධානවලට අනුකූලව බැහැර කරනු ලැබීමට නොහැකි වුවහොත්, ඒ දේපළ හෝ එහි කොටස යම් පුණ්‍ය පරමාර්ථයක් සඳහා අදාළ කරනු ලැබිය යුතු අතර, ඒ පුණ්‍ය පරමාර්ථය සංස්ථාවේ සාමාජිකයන් විසින් තීරණය කරනු ලැබිය යුතු ය.

**ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.**

15. මේ පනතෙහි සඳහන් තැනැත්තන් හා ඔවුන් මගින්, ඔවුන් කෙරෙන් නැතහොත් ඔවුන් යටතේ හිමිකම් පාන්නන් හැර, ජනරජයේ යම් රාජ්‍ය මණ්ඩලයක, සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතේ අඩංගු කිසිවකින් බලපෑමක් නොවිය යුතු ය. නැතහොත් බලපෑමක් වන්නේ යයි සලකනු නොලැබිය යුතුය.

## උපලේඛනය [4(2) වගන්තිය]

**උතුරු ලංකා වෛද්‍ය වෘත්තිකයන්ගේ විද්‍යාලයේ ආරම්භක සාමාජිකයන්**

1. වෛද්‍ය ජේ. ටී. සේවියර්, ඇම්. බී. බී. ඇස්., ඇෆ්. ආර්. සී. ඇස්.
   474, උඩුවිල පාර,
   ත්‍රිකුණාමලය.

2. වෛද්‍ය ජේ. පී. සී. පිලිප්ස්, ඇම්. බී. බී. ඇස්.,
   106, කෙලින් වීදිය,
   යාපනය.

3. වෛද්‍ය වී. ගංගාධරන්, ඇම්. බී. බී. ඇස්.
   වැන් වෙස්ට් චිකිත්සාගාරය,
   18, අයියනාර් කෝවිල් පාර,
   යාපනය.

4. වෛද්‍ය එස්. වාමදේවන්, ඇම්. ආර්. සී. පී. සී. සී. එච්.
   107, ඒ. වී පාර,
   යාපනය.

5. වෛද්‍ය එස්. නාගනාදර්, ඇම්. බී. බී. ඇස්.
   මාතෘ හා සාත්තු නිවාසය,
   වෙළඳපොල චතුරශ්‍රය,
   වන්කාතෙයි.

6. වෛද්‍ය බී. ගණේශමූර්ති ඇම්. බී. බී. ඇස්.
   වැන් වෙස්ට් චිකිත්සාගාරය,
   වන්නාර්පන්නි,
   යාපනය.

7. වෛද්‍ය පී. ෂන්මුගරාජා ඇම්. බී. බී. ඇස්.
   චාවකච්චේරි සාත්තු නිවාසය හා චිකිත්සාගාරය,
   චාවකච්චේරි.

8. වෛද්‍ය එස් අරුණාචලම්, ඇම්. බී. බී. ඇස්.
   තිරුනල්වේලි උතුර,
   යාපනය.

9. වෛද්‍ය පී. සිවපාලන්, ඇම්. බී. බී. ඇස්.
   සන්නති පාර,
   අච්චුවේලි.

10. වෛද්‍ය. එස්. සී. ජෙයරාජ්, බී. ඇල්. ඕ. ඩී. ටී. ඇම් සහ එච්, ඇෆ්. අයි. සී. ඇස්.
    48, ඒ, කච්චේරි නල්ලූර් පාර,
    යාපනය.

11. වෛද්‍ය ඇස්. ජී. ලූකස්, ඇම්. බී. බී. ඇස්.
    24, සෝමසුන්දරම් ඇවනිව්,
    චුන්ඩුකුලි.

12. වෛද්‍ය ඉන්දිරා නාගනාදර් මහත්මිය, ඇම්. බී. බී. ඇස්.
    මාතෘ හා සාත්තු නිවාසය,
    වන්කාතෙයි.

13. වෛද්‍ය එස්. සබාරත්නම්, ඩී. ටී. ඇම් සහ එච්
    වෙම්බඩි පොලි ක්ලිනික්,
    2, පලමුවන කරස් වීදිය,
    යාපනය.

14. වෛද්‍ය ඒ. සිවපාලසුන්දරම්, ඇම්. බී. බී. ඇස්, ඇම්. ආර්. සී. පී.
415, කේ. කේ. ඇස්. පාර,
යාපනය.

15. වෛද්‍ය එස්. ෂන්මුගලිංගම් ඇම්. බී. බී. ඇස්.
180, නාවලර් පාර,
යාපනය.

16. වෛද්‍ය එස්. සිවානන්දරාජා, ඇම්. බී. බී. ඇස්.
වෛද්‍ය මධ්‍යස්ථානය,
ආනෛකෝට්ටෛ.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 177 කි. (විදේශීය) රු. 236 කි. කොළඹ 1. රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.